සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	7 ශ්‍රේණිය	**සිංහල භාෂාව හා සාහිත්‍යය I -II**	කාලය நேரம் Time — පැය 02යි

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- I කොටසට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයා, II කොටස සමඟ අමුණා භාර දෙන්න.

I කොටස

- පහත ඉරි ඇඳි යෙදුමට ගැළපෙන සාම්ප්‍රදායික යෙදුම තෝරන්න.

1. මුහුදු රළ ප්‍රචණ්ඩ වී බෝට්ටුව පෙරළීමෙන් සේතන් මාමා <u>අවසාන මොහොතේ යාන්තමින්</u> දිවි ගළවා ගත්තේ ය.
   - i අන්තිමට ම
   - ii අවසාන අවස්ථාවේ
   - iii අවසන් හුස්ම පොදේ
   - iv අනු නවයෙන් බේරුණා

2. මනුර <u>නිෂ්ඵල ක්‍රියාවල නිරත වීම</u> කාගේත් කතාබහට ලක්විය.
   - i වැඩක් නැති දේ කිරීමෙන්
   - ii ගහට ඉනි කැපුවා වගේ
   - iii මඩේ සිට වූ ඉන්න වගේ
   - iv කළුවා මාරපන් ගියා වගේ

3. අතවැස්සන් ,වෙහෙලි, ආස්තරණය ,සිලිලාර යන පදවලට පිළිවෙළින් අර්ථ විවරණ සපයන පිළිතුර වනුයේ,
   - i ශිෂ්‍යයන් ,නාරටි, ඇතිරිල්ල ,ජලතලාව
   - ii ජලතලාව ,ඇතිරිල්ල, නාරටි, ශිෂ්‍යයන්
   - iii ශිෂ්‍යයන් ,ජලතලාව, නාරටි, ඇතිරිල්ල
   - iv නාරටි, ශිෂ්‍යයන් ,ඇතිරිල්ල ,ජලතලාව

4. මහාප්‍රාණ, අල්පප්‍රාණ ,සඤ්ඤක අකුරු පිළිවෙළින් යෙදුණු පද ඇතුළත් වරණය,
   - i සගයා ,මන්ථ ,කඳු
   - ii රථය ,කද ,කඳ
   - iii කඳු ,කද ,සගයා
   - iv කද ,මන්ථ ,කඳ

- 5 සිට 7 තෙක් දී ඇති ප්‍රශ්නවල අක්ෂර වින්‍යාසය නිවැරදි පදය තෝරන්න.

5.	i.නය	ii.ප්‍රනාම	iii.පුරාණ	iv.ප්‍රාන්ථ
6.	i.ලාබාළ	ii.ළැහැබ	iii.ලැම	iv.ලඟ
7.	i.නිෂ්ක්‍රීය	ii.නිශ්පාදන	iii.ප්‍රස්ථාව	iv.ආභාෂය

Past Papers Wiki

8. "අපි හෙට ගමට යමු." වාක්‍යයේ 'යමු' යනු;
   i. ප්‍රථම පුරුෂ වර්තමානකාල ඒක වචන ආඛ්‍යාතයකි.
   ii. උත්තම පුරුෂ අනාගතකාල බහුවචන ආඛ්‍යාතයකි.
   iii. උත්තම පුරුෂ වර්තමානකාල බහුවචන ආඛ්‍යාතයකි.
   iv. මධ්‍යම පුරුෂ වර්තමානකාල බහුවචන ආඛ්‍යාතයකි.

9. පැහිරිබෝය, රසබෝය, සේදැරි යන කමත් වහර පිළිවෙළින් සාමාන්‍ය ව්‍යවහාරයේ යෙදෙන පිළිතුර වනුයේ.
   i. හකුරු ,ඉක්මන් ,බුලත්විට ii බුලත්විට ,හකුරු ,ඉක්මන්
   iii ගිනිමැලය ,ඉක්මන් ,හකුරු iv හකුරු ,බුලත්විට ,ඉක්මන්

10. පහත කවියේ පද්‍ය පාද සම්පූර්ණ කරන්න.
    තමහට නොසරි වන
    සබා මැද හිදිනුය කර බා
    _ _ _ _ _ _ _ _ _ _ _ _ _
    _ _ _ _ _ _ _ _ _ _ _ _ _

- තද කළු අකුරින් යෙදී ඇති පද සඳහා විරුද්ධාර්ථ පදය හිස්තැන් හි ලියන්න.

11. ගුරුවරයා දරුවන්ගේ **අවගුණ** මැඩලමින් _ _ _ _ _ _ _ _ _ _ රෝපණය කරයි.

12. ඔහු **නොබියව** සටන් වැද _ _ _ _ _ _ _ _ _ _ තුරන් කළේ ය.

13. නංගී ගඟට <u>ගොස්</u> දියේ එබෙමින් ඒ මේ අත <u>පිහිනමින්</u> නැවා ය.ඉරි ඇඳි පද ඇතුළත් ක්‍රියාපද පිළිවෙළින් දැක්වෙනුයේ,
    i.පූර්ව ක්‍රියා ,පූර්ව ක්‍රියා ii.පූර්ව ක්‍රියා ,මිශ්‍ර ක්‍රියා
    iii.මිශ්‍ර ක්‍රියා ,අවසාන ක්‍රියා iv.මිශ්‍ර ක්‍රියා ,මිශ්‍ර ක්‍රියා

14. මහපුදුමෙකි - **මලක මලෙකි** යන්නෙහි යෙදී ඇති කාව්‍යාලංකාරය කුමක් ද?
    i.උපමා ii.අනුප්‍රාසය
    iii.රූපක iv.විරිත

- සමානාර්ථ පද දෙක බැගින් ලියන්න.

15. අහස : _ _ _ _ _ _ _ _ _ _ , _ _ _ _ _ _ _ _ _ _
16. මාතාව : _ _ _ _ _ _ _ _ _ _ , _ _ _ _ _ _ _ _ _ _

- තනි පද ලියන්න.

17. කිසිවෙකුට බැඳීමක් නැති : _ _ _ _ _ _ _ _ _ _
18. දියෙහි හැසිරෙන : _ _ _ _ _ _ _ _ _ _

- විශේෂණ පද යොදන්න.

19. _ _ _ _ _ _ _ _ _ _ නංගී වේදිකාව මත _ _ _ _ _ _ _ _ _ _ රංගනයක නිරත වුවා ය.

20. ආරාධනා පතක අඩංගු නොවිය යුතු අංගයක් වන්නේ,
    i.අරමුණ ii.ලබන්නාගේ ලිපිනය
    iii.දිනය iv.ස්ථානය

[ලකුණු 2 × 20 = 40]

Past Papers Wiki

II කොටස

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. ඔබ පන්තිකාමරයේ දී සිදුකරන ලද කණ්ඩායම් ක්‍රියාකාරකම ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.
   i. 'මා දුටු මුල් හිරු පෙන්නුව ලංකා' ගීතයේ රචකයා කවුද?
   ii. ඔබ කණ්ඩායම ගායනා කළ දේශාභිමානී ගීතයක මුල් දෙපද ලියා දක්වන්න.
   iii. මෙම ක්‍රියාකාරකමෙහි නිරත වීමෙන් ඔබ ලැබූ අද්දැකීම් 2ක් ලියන්න.
   iv. මෙවැනි ක්‍රියාකාරකමක දී ඔබ මුහුණ පෑ ගැටලු 2ක් ලියන්න.
   v. එම ගැටලු අවම කිරීමට ගත් උපක්‍රම 2ක් ලියන්න. [ලකුණු 2 × 5 = 10]

2. පහත දැක්වෙන මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 150කට නො අඩු වන සේ රචනයක් ලියන්න.
   i. කියවමු - දිනමු.
   ii. මම මගේ රටට ආදරෙයි.
   iii. වැඩිහිටියන්ට සළකමු.
   iv. සොබා දහමේ අපූරු දායාද සුරකිමු.
   v. මම හෝර්ටන් තැන්නේ ඇවිද ගියෙමි. [ලකුණු - 20]

3. ඔබ ප්‍රදේශයේ මේ දිනවල ශීඝ්‍රයෙන් පැතිරී යන වෛරස් උණ රෝගී තත්ත්වයක් හේතුවෙන් ගම්මුන් අසීරුතා රැසකට මුහුණ දී ඇත. දිනෙන් දින ජීවිත ද බිලිගනිමින් පවතී. මෙම තත්ත්වය වළකාලීමට සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහනක් පවත්වා ජනතාව දැනුම්වත් කිරීමට තීරණය කර ඇත. එම වැඩසටහන සඳහා ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමාට යැවෙන රාජකාරි ලිපියක් සකස් කරන්න. ඔබ 'සියත' සමිතියේ ලේකම් - අනුර අබේසේකර යැයි සිතන්න.
   [ලකුණු - 10]

4. පෙළපොත ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
   i. "අතට වැර දී සිරිය තදින් ඇද්දේ යැ."
   මෙය ඇතුළත් පාඩමේ නම කුමක් ද?
   ii. "පසු නොබලා දිව්වා එපිට"
   මෙය ඇතුළත් පාඩම කුමක් ද?
   iii. "ඇයි තොප කුමට අවුදැ'යි"
   මෙම ප්‍රකාශය කාගේ ද?
   iv. "බැහැ.ඔයාට ඒක තියාගන්න බැහැ."
   මෙම ප්‍රකාශය ඇතුළත් කෘතිය කුමක් ද?
   v. "තව ටිකකින් කළු ගගුල එවන්නම්"
   'කළු ගගුල' යනු මොනවා ද? [ලකුණු 2 × 5 = 10]

5. පහත සඳහන් ඡේදය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ලංකාවේ දක්ෂිණ භාගයේ අන්තය දෙවුන්දර - තුඩුව බවත් ,එහි ප්‍රදීපාගාරයක් පිහිටුවා ඇති බවත් ඇගේ ගුරුතුමිය පන්තියේ දී ඉගැන්වූ දා සිට මගේ දියණිය ඒ ගැන අමුතු විස්මයකින් කතා කරන්නට වුවා ය.එම ප්‍රදීපාගාරයේ සංඥා එළියෙන් නැව්වල කපිතන්වරුන් ස්වකීය යාත්‍රා හසුරුවන සැටි ද ගුරුතුමියගෙන් අසා උගත් ඈ ගෙදර පැමිණි මොහොතේ සිට මගෙන් නොයෙකුත් ප්‍රශ්න අසන්නට වුයේ ඒ පිළිබඳ ඇගේ සිත්හි කිසියම් අත්භූත හැඟීමක් ජනිත වී තිබීම නිසා ය. ඒ හැරත් ලංකා සිතියමෙහි පෙන්වා ඇති අන්දමට නළලින් මතු වූ කුඩා බුබුළක් මෙන් මුහුදු තුළට පැහැදිලිව නෙරා ගිය පෙදෙසක් දෙවුන්දර තුඩුව යනුවෙන් නම් කොට තිබීම නිසා එවැනි ගොඩැල්ලක් පියෙවි ඇසට ද එලෙසින්ම දැකිය හැකි යයි ද ඒ මත පිහිටි ප්‍රදීපාගාරය අමුතු ආශ්චර්යජනක දර්ශනයක් විය හැකි යයි ද සිතා සිටින බව ඇගේ ප්‍රශ්න හා විස්තරවලින් මට වැටහී ගියේ ය.

[ප්‍රදීපාගාරය යට - රන්ජිත් ධර්ම කීර්ති]

i. මෙම ඡේදයේ වර්ණනා කරනුයේ කුමක් ද?
ii. එය පිහිටියේ කොහේ ද?
iii. එහි සංඥා එළි උදව් කරන්නේ කා හට ද?
iv. මෙහි සඳහන් උපමාවක් ලියන්න.
v. මූර්ධජ අකුරු දෙකක් එක ළඟ යෙදුණු වචනයක් ඡේදයෙන් උපුටා ලියන්න.

[ලකුණු 2 × 5 = 10]

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank